03.වසර 20 ක සේවා කාලයක් සපුරා ඇති සමෘද්ධි සංවර්ධන නිළධාරීන් 1 ශ්‍රේණියට උසස් කිරීම සඳහා අධිකාරිය සමයේදී පැවති කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වී ඇත්නම් කඩිනමින් නව ඇමතිවරයාගේ අත්සනින් අමාත්‍යමණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඔවුන් සියලු දෙනා 1 ශේණියට උසස් කිරීමට අවශ්‍ය සහනය ලබාදීමට සූදානම් බව දැන්වීය.

04.පෙරදාතම සේවකයින් හට රජයේ භාරය වාරික 60 කින් ගෙවා අවසන් කිරීම වෙනුවෙන් ලබා දුන් කාල සීමාව වාරික 120 ක් දක්වා දීර්ඝ කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව එකගවී ඇති බවත් EPF මුදල සඳහා ලද පොලී මුදල සේවකයා වෙත ලබා දීමට සාධාරණ බැවින් අප් වෙනුවෙන් නැවත වතාවක් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට තීරණය වී ඇත.

05.සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සඳහා MN – 3 වැටුප් කේතය ලබාදීමට අදාලව අවශ්‍ය කරුණු පැහැදිලි කිරීම සිදුකළත් ඒ සඳහා අනුමැතිය ලබා දීම සිදු නොකල බවත් එම නිසා දීර්ඝ කරුණු පැහැදිල කිරීමක් සමග අදාල ආයතන වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් නැවත යොමු කිරීමටත් එයටද අනුමැතිය නොලදහොත් MN – 2 වැටුප් කේතය ලබාදීමට අදාලව අවශ්‍ය කටයුතු කිරීමටත් ඒ සඳහා ද අදාල ආයතන වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් නැවත යොමු කිරීමටත් යෝජනා වී ඇත.

06.සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිළධාරීන් අතර ඇතිවී තිබෙන දැඩි වැටුප් විශමතාවය ඉවත් කිරීම සඳහා වැටුප් පියවර 05 ක් ඉහලින් තැබීමට සකස් කර තිබූ යෝජනාව සම්බන්ධයෙන් 2020.11.25 දින තීරණයකට එළඹීමට නොහැකි වී ඇත.

07. 2017 වර්ෂයේ බඳවාගත් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා විභාගය අසමත් පැරණි සමෘද්ධි නිළධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය එම විභාගය 2020 දෙසැම්බර් හෝ 2021 ජනවාරි මස අවසන් වීමට ප්‍රථම පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරන බව අධ්‍යක්ෂ ජනරාල් තුමන් විසින් ප්‍රකාශ කළා.

08.අප සංගමයේ ඉල්ලීම මත සමෘද්ධි නිළදරු ණය මුදල සඳහා 9 % ක් වූ පොලී අනුපාතය 8 % ක් දක්වා අඩුකිරීමට කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර ඉදිරියේදී ඊට අදාල චක්‍රලේඛණය නිකුත් කරණ බව දැනුම්දෙන ලදී.

**සේවක අයිතිවාසිකම් දිනාගැනීමට අප සංගමය සමග**
**අත්වැල් බැදගන්නා ලෙසට**
**කාරුණිකව මෙයින් ඇරයුම් කරමි.**


සභාපති
එන්.ඒ.එම්.අයි.බී.අබේසිංහ
දු.අං..071-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු.අං.071- 4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ජී.වී.බස්නායක
දු.අං.071-8191473